සුවෙන් පෙරට

**e ඉගෙනුම් පියස**

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

වාරය - 01

| | | |
|---|---|---|
| ශ්‍රේණිය : **10** | විෂයය :<br>**ගෘහ ආර්ථික විද්‍යාව** | පාඩම : **විවිධ මැහුම් ක්‍රම**<br>**නිපුණතාව - 10**<br>**ගෘහීය අවශ්‍යතා සඳහා නිර්මාණ සකස් කිරීමේදී විවිධ මැහුම් ක්‍රම යොදා ගනියි.**<br>**නිපුණතා මට්ටම : 10.1**<br>**විවිධ මැහුම් ක්‍රම හඳුනාගෙන ඒවා අත්හදා බලයි.** |



රෙදිපිළි මැසීමේ දී හා අලංකාර කිරීමේ දී විවිධ මැහුම් ක්‍රම රාශියක් උපයෝගී කරගනු ලැබේ. ඇතැම් විට එකම නිර්මාණයක් සඳහා මැහුම් ක්‍රම කිහිපයක් භාවිතා කළ හැකි ය.

මෙම ගෘහපිළි සඳහා මැහුම් ක්‍රම යොදා ගැනීමෙන් ගෘහීය අභ්‍යන්තර අලංකරණය වර්ධනය කරගත හැකිය.

***උපාංග :-***



* යම්කිසි ස්ථානයක ප්‍රධාන ගෘහ භාණ්ඩ වලට අමතරව අලංකාරය ඇති කිරීමට හෝ අලංකාරය හා ක්‍රියානුරූපී බව ඇති කිරීමට භාවිතා කරන දෑ උපාංග ලෙස හැඳින්වේ.

* නිර්මාණයකින් ඉටු විය යුතු කාර්යය නිසි පරිදි ඉටු වන සේ සැකසී තිබීම ක්‍රියානුරූපී බව ලෙස හැඳින්වේ.

# උපාංගවල ප්‍රයෝජන

- අලංකාරය, ක්‍රියානුරූපී බව හා නිර්මාණාත්මක බව ගෙන දීම.

ලියුම් රඳවනය



බිත්ති සැරසිල්ල



අත්පිස්නා රඳවනය



**පිරිසැලසුම යනු,**

උපාංගයක් නිර්මාණය කිරීමට ප්‍රථම පතොරමක් සකස් කිරීම සුදුසු රෙදි වර්ගය හා අවශ්‍ය ප්‍රමාණය තීරණය කිරීම, රෙදි වර්ග හා ඒවායේ වර්ණ ගැළපීම, මැසීම සඳහා ගනු ලබන නූල් වර්ග හා එහි වර්ණ ගැලපීම ඇතුලත් දළ සැලැස්ම පිරිසැලසුම වේ.

අත් සැරසිලි යනු ගෘහ පිළිවල සහ ඇඳුම් වල අද්දර අලංකාර කර ගැනීම සඳහා යොදනු ලබන විවිධ ක්‍රම වේ.
උදා:-

* රේන්ද ඇල්ලීම



* බඳන යෙදීම

* රැලි පටි ඇල්ලීම


- මැහුම් ක්‍රම මෙසේ කාණ්ඩ කරමු.
    1. මූලික මැහුම්
    2. විසිතුරු මුහුම්
    3. ශිල්පීය මැහුම්

මැසීම තුළින් නිර්මාණයක් ගොඩනැගීමේ දී අනිවාර්යෙන්ම යොදා ගන්නා මැහුම් ක්‍රම මූලික මැහුම් ලෙස හැඳින්වේ.

**තාවකාලික මැහුම් ක්‍රම (අස්ථිර)**

❖ **නූල් ඇදීම**


- මෙය දකුණේ සිට වමට මසනු ලැබේ.
- ගැටයකින් ආරම්භ කර පිස්මෙන්තු මැස්මකින් අවසන් කරනු ලැබේ.



**ස්ථිර මැහුම් ක්‍රම**

❖ **සිහින් නූල් දුවවීම**

- මෙය දකුණේ සිට වමට මසනු ලැබේ.
- සිහින් නූල් දුවවීම ආරම්භ කිරීමට පිස්මේන්තු මැස්ම 2ක් හෝ 3ක් යොදා අවසන් කළ යුතු වේ.
- සිහින් නූල් දුවවීමේ දී රෙද්දේ නූල් 2ක් හෝ 3ක් ඇල්ලීමෙන් අලංකාරය වැඩිවේ.



## ❖ වාටි මැස්ම

- දකුණේ සිට වමට මසනු ලැබේ.
- වාටියක් නවා නූල් අදින්න.
- මැසීම ආරම්භයේ දී ආරම්භක ස්ථානයට 1cm පමණ ඉදිරියෙන් ඉදිකටුව ගසා රෙදි දෙපොට තුළින් ගෙන වාටිය ආරම්භක ස්ථානයෙන් මතු කරන්න.
- නූලේ කෙළවර රෙදි දෙපට අතර සඟවා ඉදිකටුව ඇල හැඩයට ගසමින් ඉදිරියට මසන්න.
- මැස්ම කුඩා හා ඒකාකාරී විය යුතුය. හොඳ පිට මැස්මේ නූල ඉතා අඩුවෙන් පෙනිය යුතු ය.
- මැස්ම අවසානයේ ආපසු මැස්ම තුනක් මසන්න.



## ❖ පිස්මේන්තු මැස්ම

- දකුණේ සිට වමට මසයි. ආරම්භ කිරීමට පිස්මේන්තු මැස්ම 2ක් හෝ 3ක් යොදා අවසානයේ මැස්ම 2ක් හෝ 3ක් යොදා අවසන් කරන්න.
- මෙහිදී මැසූ පළමු මැස්මට මදක් ඉදිරියෙන් රෙද්දේ නොපිටින් ඉදිකටුව ගසා මතුකර නැවත ආපස්සට පෙර අවසන් කරන ලද මැස්ම ළඟ ඉදිකටුව ගසා ඉදිරියට මැසීම සිදු කරයි.
- මැස්මේ හොඳ පිට මහන යන්ත්‍රයේ මැහුම් හා සමාන වන අතර නොපිට නැමි මැස්ම මෙන් දිස් වේ.



**ඇගයීම**

01. පහත කොටුව තුළ ඇති දේ අධ්‍යයනය කර වගුවේ අදාළ මාතෘකාව යටතට ගොනුගත කරන්න.

| |
|---|
| දුඹුරු කඩදාසි, ගම්, රිබන්, බොත්තම්, දැති කතුර, පැන්සල, අඩි කෝදුව, මහන යන්ත්‍රය, ස්ත්‍රික්කය, ඉදිකටුව, අල්පෙනිති, රෙදි, කැරලි නූල් |

| උපකරණ | මෙවලම් | ද්‍රව්‍ය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

02. අක් සැරසිලි යන්න හඳුන්වා උදාහරණ 2ක් දෙන්න.
03. උපාංග නම් කරන්න.
04. මූලික මැහුම් ක්‍රම 4ක් නම් ලියන්න.
05. තාවකාලිකව යොදන මැහුම් ක්‍රමය නම් කර එය යෙදීමෙන් ඇති ප්‍රයෝජන 02ක් දක්වන්න.
06. ස්ථිර මැහුම් ක්‍රමයක් වන සිහින් නූල් දුවවීම යොදාගත හැකි අවස්ථා 04ක් රූප සටහන් මගින් පෙන්වා නම් කරන්න.
07. පොළොව් වර්ග තුනක් නම් කරන්න.
08. උපාංග නිර්මාණයේ දී අනුගමනය කළ යුතු යහපත් වැඩ පුරුදු හා ආරක්ෂිත පූර්වෝපාය ලියා දක්වන්න.
09. පහත දැක්වෙන දේවල් වලින් කෙරෙන කාර්යය ඉදිරියෙන් ලියා දක්වන්න.
10. කුෂන් කවරයක ඉදිරිපසට යෙදීමට සුදුසු මෝස්තරයක් ඇද දක්වන්න.

(අඟල් 2×2 කොටුවක්)

(පිටු අංක 133-139 දක්වා අධ්‍යයනය කර පිළිතුරු සපයන්න.)


මෙහෙයවීම :- සහකාර අ.අ. තාක්ෂණ
H.K.D. අනූෂා තරංගනී මිය.

සැලසුම් කිරීම හා මග පෙන්වීම :- ගුරු උපදේශක, දිවුලපිටිය කොට්ඨාශය
B.H.M.S. විජේසිංහ.

සැකසුම සහ ඉදිරිපත් කිරීම :- D.T.K. ගුණසිංහ.
බප/මිනු/ශ්‍රී සරණතිස්ස ක.වි. බඩල්ගම.